# රෝග ප්‍රතිකර්ම හා ස්වස්ථතාවː බෞද්ධ ආයුර්වේදයට පෙරවදනක්

බුදුන් වහන්සේ වූකලී සත්වයාගේ දුක් ව්‍යසන දුරුකිරීම සඳහා සාංසාරිකව දීර්ඝ කාලයක් තිස්සේ අනවරත පර්යේෂණයක නිරතව එහි ඵලප්‍රාප්තිය ලගා කරගත් උතුමන් වහන්සේ නමකි. උන්වහන්සේගේ මූලික අභිප්‍රාය වූයේ කායික රෝග ව්‍යපසමනය කිරීම නොව මානසික රෝග මූලිකව පවතින දුක සමනය කිරීමයි. එහෙත් කායික රෝග ව්‍යපසමනයකින් තොරව මානසික සමනයක් ඇති කිරීමේ දුෂ්කරතාව උන්වහන්සේ මැනවින් දැන සිටියහ. මේ නිසා කායික ස්වස්ථතාව පවත්වා ගෙන යාමට අවශ්‍ය නිර්දේශයන් උන්වහන්සේගේ පැනවීම් තුළ බහුලව දක්නා ලැබේ. කායික ස්වස්ථතාව හා මානසික ස්වස්ථතාව යන උභය ස්වස්ථතා පිළිබද මනා අවබෝධයක් තිබූ හෙයින් හා උපන් රෝග මැඩ පැවැත්වීම විෂයෙහි උසස් ක්‍රමවේදයන් හඳුන්වා දුන් බැවින් **වෙජ්ජූපමො මහාවීරො**[1] (ජිනේන්ද්‍රයන් වහන්සේ වෙදෙකු වැනිය) **අගදූපමො මහාවීරො**[2] (ඖෂධයක්ට උපමා ඇති මහාවීරයන් වහන්සේ) **භිසක්කො** (වෛද්‍යවරයා) **සල්ලකත්තො**[3] (ශල්‍ය වෛද්‍යවරයා) යනාදී විශේෂණ නාම බුදුන් වහන්සේ විෂයෙහි භාවිත වී ඇත. මේ බැව් මැනවින් දත් ආයුර්වේද ග්‍රන්ථ රචනා කළ පැරණි පඬිවරු පවා **භෛෂජ්‍යගුරු, අපූර්වවෛද්‍ය** යනාදී විශේෂණ නාමයන්ගෙන් බුදුන් වහන්සේ හැඳින්වීමට පසුබට නොවූහ.අෂ්ටාංගහෘදය නම් ආයුර්වේද ග්‍රන්ථය රචනා කළ වාග්භට ආචාර්යවරයා ග්‍රන්ථාරම්භයේදීම බුදුන් වහන්සේට ප්‍රණාම දැක්වීම මෙයට නිදසුනකි. බුද්ධ දේශනාවෙහි හමුවන යම් යම් ප්‍රකාශන විමසා බලන විට ස්වස්ථතාව යන්න පිළිබඳ බුදුන් වහන්සේගේ දැක්ම අපූර්ව බව පිළිගැනීමට සිදුවේ. ලෝක සෞඛ්‍ය සංධානය (World Health Organization) කෙනෙකු පූර්ණ ස්වස්ථතාවෙන් යුත් පුද්ගලයෙකු යැයි නිර්ණය කිරීමට අවශ්‍ය සාධක කවරෙදැයි අර්ථ නිරූපණය කොට ඇත්තේ කරුණු හතරක් සම්පූර්ණවීම යටතේය.[4] (Health is a state of complete physical, mental, and social well-being and not merely the absence of disease or infirmity) එනම් 1. Physical Health (කායික ස්වස්ථතාව) 2. Mental Health (මානසික ස්වස්ථතාව) 3. Social Health (සාමාජයීය ස්වස්ථතාව) 4. Spiritual Health (අධ්‍යාත්මික ස්වස්ථතාව) යනුවෙනි. බුදුදහමෙහි අතිශය ප්‍රකට ආරොග්‍යපරමා ලාභා යනාදී ගාථාවේ මෙම සංකල්පය අන්තර්ලීනව ඇති බව විද්වතුන්ගේ මතයයි. ඒ අනුව **ආරොග්‍යපරමා ලාභා** යන්නෙන් අදහස් වන්නේ මෙහි පළමුවැන්න වන (Physical Health) කායික ස්වස්ථතාවයි. **සන්තුට්ඨීපරමං ධනං** යනනෙන් අදහස් වන්නේ (Mental Health) මානසික ස්වස්ථතාව යන්නය. **විස්සාසා පරමා ඤාති** යනු සාමාජයීය ස්වස්ථතාව (Social Health) වන අතර **නිබ්බාණං පරමං සුඛං** යන්නෙන් (Spiritual Health) අධ්‍යාත්මික ස්වස්ථතාව අදහස් වේ. බුදුදහමේ මෙම නිර්වචනය සැබැවින්ම ලෝක සෞඛ්‍ය සංධානයේ (W H O) නිර්වචනයටත් වඩා පුළුල් අර්ථ නිරූපණයකින් යුක්ත වූවක් බව කිවයුතු වන්නේ කාලීන හා ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයන් අනුව ද සලකා බැලීමෙනි. යථෝක්ත කරුණු සම්බන්ධයෙන් මෙන්ම ආයුර්වේදයට බුදුදහමේ ඇති ඓතිහාසික සබඳතාව පිළිබඳ වැඩි අවබෝධය සඳහා මහාචාර්ය **සුමනපාල ගල්මංගොඩ** මැතිඳුන් විසින් රචනා කරන ලද **ආයුර්වේද මනෝකායික චිකිත්සා ක්‍රමය** නම් කෘතිය කියවීම වඩාත් සුදුසුය. විශාල පිරිසක් පරිපාලනය කිරීමේ වගකීමක් ඇතිව කටයුතු කළ කෙනෙකු වශයෙන් බුදුන් වහන්සේ භික්ෂු සංස්ථාව තුළ උද්ගත වන

සෞඛ්‍යමය ගැටලු සම්බන්ධයෙන් යෙදූ පිළියම් පිළිබඳව විමසා බලන විට සහ අර්ථකථන ටීකා ග්‍රන්ථවල එම ඥානය ඉදිරියට පවත්වාගෙන යාමට කරන ලද විවරණයන් ද **සාරාර්ථසංග්‍රහය භෛෂජ්‍යමඤ්ජුසා ප්‍රමේහෞෂධමඤ්ජරී යෝගසේකරය අරිෂ්ටමාලාව සූතකාරෝග චිකිත්සා සාරසංග්‍රහය** වැනි දේශීය ආයුර්වේද ග්‍රන්ථ පරීක්ෂා කරන විට පෙනී යන්නේ ආයුර්වේදයේ දියුණුවට ද බුදුදහමින් ලැබුණු දායකත්වය සුළු පටු නොවන බවයි. මෙම ලිපියේ අරමුණ වන්නේ බුදුන් වහන්සේ තුළ පැවැති ආයුර්වේදී විඥානය පිළිබඳව විමසා බැලීමක් නොවන හෙයින් එය විද්වත්ගේ සැලකිල්ලට භාජනය විය යුත්තකි. මෙහි මූලික අරමුණ වන්නේ රෝගාබාධ සම්බන්ධයෙන් පෙළ සාහිත්‍යයෙහි සඳහන් වන කරුණු කිහිපයක් පිළිබඳ සමාලෝචනයක යෙදීමයි.

**රෝග** සහ **ආබාධ** යන පද දෙක සමයාථී පදද්වයක් ලෙස බහුල ව්‍යවහාරයෙහි පවතී. එහෙත් රෝග සහ ආබාධ යන පදද්වයෙහි සියුම් අර්ථමය වෙනසක් ඇති බව පෙනේ. රෝග යන පද සෑදී ඇත්තේ **රුජ** ධාතුවෙන් වන අතර **රිදීම** යන අර්ථයෙන් රෝග නම් වේ. මේ නිසා සකලවිධ රෝගී තත්වයන් රෝග ගණයට ඇතුළත් කළ හැකිය. ආබාධ යනු ඊට වඩා බරපතල තත්වයේ රෝග වේ. පිළියම් නොකළ හැකි තත්වයේ රෝගවලට ආබාධ යන්න වඩාත් යෝග්‍ය බව සැලකිය හැකිය. **ආබාධාති ඉමිනා අතෙකිච්ඡෙන වාතාපමාරාදිනා රොගෙන සමන්නාගතො නිට්ඨාප්පත්තගිලානො කථිතො**[5] (ආබාධ යන මෙයින් පිළියම් කළ නොහැකි වාත අපස්මාර ආදි රෝගයෙන් යුක්ත වූ නිෂ්ටාප්‍රාප්ත රෝගියා කියන ලදී) යන අටුවා විග්‍රහයෙන් එය අනාවරණය වේ. රෝග යන්න නිර්වචනය වන්නේ සෞඛ්‍ය තත්වය යහපත් නොවීම යනුවෙනි. සැබැවින්ම එය හෙතුව සොයා නොගත් කිසියම් දුර්වල සෞඛ්‍ය තත්වයකි. බටහිර වෛද්‍යවිද්‍යාවේ එය හඳුන්වනුයේ (illness) යනුවෙනි. එහෙත් ආබාධයක් (disease) යන්න එහි නිර්වචනය වන්නේ වෛරසයක් වැනි කිසියම් රෝගකාරක තත්වයක් නිසා ශරීරය හෝ ශරීරාවයවයක් අසාමාන්‍ය තත්වයට පත්වීමයි. එයින් මරණයට පවා පත්විය හැකිය. රෝගයක් සෑදුණ කෙනෙකු එයින් පෙළීමකට පත්විය හැකි අතර එයින් නොපෙළෙන තත්වයෙන් ද සිටිය හැකිය. ආබාධයකට පාත්‍ර වූවෙකුට දැඩි පෙළීමකට පත්වීමට සිදුවේ. එහෙයින් දැඩිසේ පෙළෙන පිළියම් කිරීමට අපහසු තත්වයේ රෝගයන් ආබාධ ලෙස ගැනීම වඩා යෝග්‍ය බව නූතන අර්ථකථන මෙන්ම බෞද්ධ අර්ථකථනවලින් ද පැහැදිලි වේ.

**භෞතික ශරීරය**

රෝගාබාධ වූකලී භෞතික ශරීරයක් පරිහරණය කරන කවරෙකුට වුවත් මුහුණ දීමට සිදුවන තත්ත්වයකි. අයුර්වේදයේ මූලික ප්‍රයත්නය වන්නේ භෞතික ශරීරයක් තුළ පවතින ධාතු සාම්‍යය අඛණ්ඩව පවත්වාගෙන යාමයි. භෞතික ශරීරයේ දෝෂ ධාතු මල විෂම වූ කල්හි වැඩි වූ දෝෂයන් අඩු කිරීමත් අඩු වූ දෝෂයන් වැඩි කිරීමත් මගින් සම තත්වයකට ගැනීම එයින් අපේක්ෂිතයි. බෞද්ධ සාහිත්‍යයේ ද මෙම තත්වයන්ට සමාන විග්‍රහයන් දක්නා ලැබේ. ආයුර්වේදයේ මෙන්ම වාත පිත්ත කඵ යන ත්‍රිදෝෂයන් අසමතුලිත වීමෙන් විවිධ රෝගාබාධයන් උපදින බව බෞද්ධ සාහිත්‍යයෙහි ද දැක්වේ. ඇතැම් විට මෙයින් මරණයට පවා පත්විය හැකි බව සඳහන් වේ. **පිත්තං වා මෙ කුප්පෙය්‍ය සෙම්හං වා මෙ කුප්පෙය්‍ය සත්ථකා මෙ වාතා කුප්පෙය්‍ය තෙන මෙ අත්තා කාලකිරියා සො මමස්ස අන්තරායො**[6]යන්නෙන් ඒ බව පැහැදිලි වේ. මීට අමතරව **පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා** යනුවෙන් වා පිත් සෙම් ආශ්‍රයෙන් රෝගාබාධ හට ගැනෙන බව ද දක්වා ඇත.

භෞතික ශරීරයේ සැකැස්ම පිළිබඳ බෞද්ධ අර්ථකථනකරුවන්ගේ විග්‍රහය **සුශ්‍රැත චරකසංහිතාදී** ආයුර්වේද ග්‍රන්ථවල විග්‍රහයට ද වඩා පුළුල් බව පැවසීම අතිශයෝක්තියක් නොවන බව බෞද්ධ හා ආයුර්වේදීය ග්‍රන්ථ තුලනය කරන්නෙකුට පැහැදිලි වන කරුණකි. අටුවා ග්‍රන්ථ අතුරින් විසුද්ධිමග්ගයේ එන විග්‍රහය පමණක් විමසා බැලීමෙන් වුවද මෙය තේරුම් ගත හැකිය. බෞද්ධ ආචාර්යවරුන්ගේ මෙම අවබෝධය තියුණු වූයේ විදර්ශනාව වැඩීමට කායව්‍යවච්ඡේදනය ගැඹුරින් සිදුකිරීමේ ප්‍රතිඵලයක් නිසා විය යුතුය. එහිදී ඔවුන් ආයුර්වේදීය පසුබිමක් ගොඩ නො නැගුයේ එය මූලික අරමුණ නොවුණ නිසා බවට සැක නැත. ශරීරය අශුචි පුඤ්ජයක් බවත් පිළිකුල් කටයුතු කෙස් ලොම් ආදියටත් අක්ෂි රෝග ආදී සියගණන් රෝගවලට ආයතනයක් වූ බැවිනුත් මෙයට කය යැයි නමක් වන බවත් බුද්ධඝෝෂ හිමියෝ පවසති. එසේම මෙය අසූවක් පණු කලයන්ට පොදු තැනකි. (**කුලවසෙනෙවෙත්ථ අසීතිකිමිකුලානි වසන්ති**) මොවුහු සම මස් නහර ඇට ඇටමිදුළු ආදී ශරීර කොටස් ඇසුරු කරමින් මේවා කා දමති.[7] ශරීරයෙහිම ඉපද එහිම මලමූත්‍ර දමමින්, එහිම පැටවුන් බිහිකරමින්, මියෙමින් වෙසෙන අයුරු විමසන විට කය වූකලී ප්‍රසූතිකාගාරයක් වැසිකිළියක් රෝහලක් හා සුසානයක් බඳුය.[8] මෙබඳු කය සමතලිතව පවත්වා ගෙන යාමට අවශ්‍ය පිළියම නො යෙදුවහොත් මරණයට ද පත්විය හැකිය.

මෙම ශරීරය තුළ කෙස් (කෙසා-hair), ලොම් (ලොමා-bodily hair), නිය (නඛා-nails), දත් (දන්තා-teeth), සම (තචො-skin), මස් (මංසං-muscles), නහර (ස්නායු) (නහාරු-tendons), ඇට (අට්ඨි-bones), ඇටමිඳුළු (අට්ඨිමිඤ්ජා-bone marrow), වකුගඩු (වක්කං-kidneys), හෘදයවස්තුව (හදයං-heart), අක්මාව (යකනං-liver), මහාප්‍රාචීරය (කිලොමකං-diaphram), ප්ලීහාව (spleen) (පිහකං - හදවතට වම්පස උදර පටලයේ මතුපිට පිහිටියකි.), පෙනහළු (පප්ඵාසං-lungs), බඩවැල් (අන්තං-large intestines), අතුණු බහන් (අන්තගුණං-mesentry), ආමාශය (උදරියං-gorge), මල (කරීසං-feces), පිත (පිත්තං-gall ), සෙම (සෙම්හං -phlegm), සැරව ( (පුබ්බො-pus), ලේ (ලොහිතං-blood), ඩහදිය (සෙදො-sweat), මේදය (මෙදො-fat), කඳුළු (අස්සු-tears), වුරුණු තෙල (වසා-greese), කෙළ (ඛෙලො-saliva), සොටු (සංඝාණිකා-mucus), ලසිකා (ලසිකා-oil in the joints), මූත්‍ර (මුත්තං-urine), හිස් මොළය (මත්ථලුංගං-brain) යනාදිය මෙහි අභ්‍යන්තරයේ වේ.[9] මේ සියල්ලේ එකතුවක් වන කයේ සැබෑ ස්වරූපය ග්‍රහණය කිරීමට යම් පමණකින් හෝ හැකි වන්නේ යෝගාවචරයෙකුට හෝ වෛද්‍යවරයෙකුට පමණකි. සාමාන්‍ය කෙනෙකුට මෙහි ප්‍රත්‍යක්ෂ වශයෙන් අවශෝෂණය කළ නොහැකි වන්නේ එය කණ්ඩරා හෙවත් සංඛ්‍යාවෙන් හැටක් වන මහශිරාවලින් ගැටගසන ලද (**සට්ඨිකණ්ඩරසම්බන්ධො**)[10] මස්වලින් තවරා (**මංසාලෙපන-ලෙපිතො**)[11] ඒ මතුපිට චර්මයකින් වසා (**චම්මකඤ්චුකසන්නද්ධො**)[12] සකසන ලද අස්ථි පඤ්ජරයක් වන බැවිනි. මෙම ශරීරය දරා සිටින්නේ අස්ථිවල ශක්තිමත්භාවය අනුවය. බුද්ධඝෝෂ හිමියන්ට අනුව සමස්ත ශරීරයේ විලුම් ඇටය, ගොප් ඇටය, කෙණ්ඩා ඇටය, උකුළු අටය, දණ ඇටය ආදී වශයෙන් අස්ථීන් 300ක් පමණ වේ.[13] (3 -119 ) විවිධ ආයුර්වේදීය පිළිගැනීම් අනුව මෙම අස්ථි සංඛ්‍යාවේ වෙනස්කම් ඇත. බුද්ධඝෝෂ හිමියන්ගේ මතය සුශ්‍රැතාචාර්යවරයාගේ පිළිගැනීම සමඟ සමාන වන බව ද මෙහිලා සඳහන් කළ යුතුය.

**රෝග නිදාන හා රෝග**

මුලින් දැක්වූ පරිදි ආයුර්වේදයේ අරමුණ ත්‍රිදෝෂ මල අපහරණ හා ධාතු සාම්‍යය පවත්වාගෙන යාමයි. ඒ අනුව වාත පිත්ත කඵ (සෙම්හ) දෝෂ බැහැර කිරීම ශරීරාභ්‍යන්තරයේ පවතින මළ අපහරණ කිරීම සහ පඨවි ආපො තේජො වායෝ යනාදී ධාතු සම තත්වයකින් පවත්වාගෙන යාමත් ස්වස්ථතාට හේතු වේ. රෝගයක් වැළඳුණු කළ එම රෝගයට හේතුව විනිශ්වය කර ගැනීම මූලික උවමනාවකි. එසේ රෝග නිදානය හඳුනා නොගැනීමෙන් පිළියම් කිරීම ඉමහත් ව්‍යසනයකට හේතු වේ. එබැවින් රෝගයකට පිළියම් කිරීමේ දී රෝග නිදානය හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. බෞද්ධ ග්‍රන්ථවල වාත පිත්ත සෙම්හ යන තුන බොහෝ රෝගයන්ගේ මූලික නිදානය වේ. අවශේෂ හේතු ද පහත සාකච්ඡාවට ගැනේ. චරකාචාර්යවරයා දක්වන පරිදි රෝග නිදාන තුනකි. ඉන් පළමුවැන්න **ආසාත්ම ඉන්ද්‍රියාර්ථ සංයෝගයයි.** මෙයින් අදහස් වන්නේ ඉන්ද්‍රියන්ගේ **අතියෝගය ආයෝගය** හා **මිථ්‍යායෝගයයි. ඉන්ද්‍රිය අතියෝගය** යනු ඉන්ද්‍රියන් උවමනාවට වඩා වෙහෙසවා ක්‍රියාකරවීමයි. අධික දීප්තිමත් හිරු රැස් ආදියට ඇස් නිරාවරණය කිරීම අධික ශබ්දවලට කන් විවර කිරීම ආදිය මීට නිදසුන්ය. **ආයෝගය** යනු යෙදවීමයි. අඩ අඳුරේ පොත් පත් කියවීම නිදසුනකි. **මිථ්‍යායෝගය**[14] යනු අධික ශීතල හෝ උණුසුම් ජලය බීම වැනි වැරදි ඉන්ද්‍රිය භාවිතයයි. දෙවැන්න පරිණාම හෙවත් දේශගුණික බලපෑමය. තෙවැන්න ප්‍රඥාපරාධ හෙවත් දැන දැන සෞඛ්‍යයට අහිතකර පුරුදුවල යෙදීමයි. වැරදි ඉරියව්වක සිට පරිගණකයක් අධික වේලාවක් තුළ පාවිච්චි කිරීම මීට නිදසුනකි. මෙකී ත්‍රිවිධ කරුණු රෝග හටගැනීමට කාරණා වේ.

රෝගාබාධ සම්බන්ධයෙන් නාමාවලි සහ නිදානමූලික දැක්වීම් පෙළෙහි දක්නට ලැබේ. **පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා** යනුවෙන් දැක්වීම නිදාන මූලික රෝග වර්ගීකරණයක් වේ. ලෝකයේ පැවති සහ අලුතින්ම ඇති වී තිබෙන රෝග සංඛ්‍යාව ගණනය කිරීම නිශ්චිත ක්‍රියාමාර්ගයක් නොවන බැවින් මෙසේ නිදාන මූලික වශයෙන් දැක්වීම සුදුසු ක්‍රමයකි. වෛද්‍යවරයෙකුට වඩා වැදගත් වන්නේ රෝගයේ නමට වඩා නිදානය හඳුනා ගැනීමයි.

රෝග පිළිබඳව සාකච්ඡා කිරීමේ දී බෞද්ධ සාහිත්‍යයෙහි තවත් ආබාධ ත්‍රිත්වයක් ගැන සඳහන් වේ. එනම් ඉච්ඡා අනසන ජරා යනුවෙනි. පුරාණ කාලයෙහි ලොව පැවතියේ මෙම රෝග තුන පමණකි. පසුව මෙය සතුන් මැරීම ආදිය හේතුවෙන් අක්ෂි රෝගාදී රෝග අට අනූවක් (98)ක් දක්වා වැඩිවිය.

තයො රොගා පුරෙ ආසුං - ඉච්ඡා අනසනං ජරා
පසූනඤ්ච සමාරම්භා - අට්ඨානවුතිමාගමා[15]

මීට වඩා පුළුල් රෝග නාමාවලියක් **ගිරිමානන්ද** සූත්‍රයේ හමුවේ.[16] ඒ අනුව අක්ෂි රෝග (චක්ඛුරොගො – eye diseases), කර්ණ රෝග (සොතරොගො hearing diseases), නාශික රෝග (ඝානරොගො - nose diseases), ජිහ්වාරෝග (ජිව්හාරොගො - tongue diseases), කායරෝග (කායරොගො - body diseases), ශීර්ෂ රෝග (සීසරොගො - head diseases), කණ්ණරොගො (කණ්ණරොගො - ear diseases), මුඛරෝග (මුඛරොගො - mouth diseases), දන්ත රෝග (දන්තරොගො - teeth diseases), තොල් රෝග (ඔට්ඨරොගො - lips diseases), කාස රෝගය (කාසො - cough), ශ්වසනරෝග (සාසො - asthma), පීනසය (පිනාසො - catarrh), දාහරෝග - (ඩහො), උණරෝග (ජරො - fever), බඩේ රුජා (කුච්ඡිරොගො - stomach ache), මූර්ඡාව (මුච්ඡා - fainting), අතීසාරය (පක්ඛන්දිකා - dysentery),

ප්‍රතිශ්‍යාව (සූලා - grippe), කොළරාව (විසූචිකා - cholera), කුෂ්ට (කුට්ඨං - leprosy), ගෙඩි (ගණ්ඩො boils ), පණුකැවිලි (කිලාසො ringworm), ක්ෂයරෝගය (සෙසො - tuberculosis ), අපස්මාරය (අපමාරො - epilepsy), සම්රෝග (දද්දු - skin disease), කැසිල්ල (කණ්ඩු - itch), කොරපොතු (කච්ඡු scab), සොරෙයසිස් නම් චර්මරෝගය (රබසා psoriasis), හොරි (විතච්ඡිකා scabies), (ලොහිතං), (පිත්තං), දියවැඩියාව (මධුමෙහො diabetes), අර්ශස් (අංසා hemorrhoids), පිළිකාව (පිළකා - ulcers), භගන්දරා (භගන්දලා - fistulas) යනාදී වශයෙන් රෝග රාශියකි.

කෙසේ වෙතත් මෙම රෝගාවලීන් බොහෝ විට දක්වා ඇත්තේ දුක්ඛ යන්න විස්තර කිරීමේ දී ය. රෝග සියල්ල කෙසේ වෙතත් අවම වශයෙන් ඉහත කී රෝග අටානුවවත් නාමමාත්‍රිකව හෝ සංග්‍රහ කළ තැනක් බෞද්ධ සාහිත්‍යයෙහි හමු නොවේ. එහෙත් සියලු රෝග ආවරණය වන පරිදි කළ යම් යම් ප්‍රකාශන එහි ඇතුළත්ය. ඒසේම බටහිර හෝ ආයුර්වේදයට හමුවන හා හමුනොවන ස්වභාවයේ රෝග විශේෂයක් පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ පැනේ. **පාපරෝග** නමින් රෝග විශේෂයක් දක්වා තිබීම එවැන්නකි. **අර්ශස්, භගන්දරා, පිත්, සෙම් රෝග** හා **කාස, සෝස** යන රෝග එම ගණයට වැටේ.[17] විනයට අනුව මෙම රෝගවලින් පෙළෙන්නන් පැවිදි කිරීම තහනම්ය. **පඤ්චාබාධ** නමින් දක්වා ඇති රෝග පහක් පිළිබඳව ද පෙළෙහි සඳහන් වේ. **කුෂ්ට ගණ්ඩ කිලාස සොස අපමාර** යනු ඒ පහයි.[18] කලෙක මගධයෙහි මෙම රෝග පහ උත්සන්න වූ බවත් එය කෙතරම් ප්‍රබලව බලපෑවේ ද යත් එම රෝගයෙන් පෙළෙන්නන් පැවිදි කිරීම පවා බුදුන් වහන්සේ විසින් තහනම් ඇත. එම **කුෂ්ට** රතු පැහැති හෝ කලු පැහැති වූ අතර **ගණ්ඩ** හෙවත් ගෙඩි විවිධාකරයෙන් සිටින බව දක්වා ඇත. **සාසපගණ්ඩ** නම් වන ගඩු විශේෂය අබ ඇටයක් තරම් වන අතර සකල ශරීරයේ පැතිර පවතී. **උණ්ණිගණ්ඩ** නම් තවත් ගඩු විශේෂයක් ගව තනපුඩු මෙන් මුළු සිරුරේ තැන තැන එල්බේ. කඩා කල **කිරි පිළකා** නම් වන ගෙඩි තරුණ වියේ දී **බර පිළකා** (රළු ගෙඩි) බවට පත්වන බවත් **විනයට්ඨකථාවේ** දක්වා ඇත. **පදුමකණ්ණිකා** නම් තවත් ගඩු විශේෂයක් සිරුර පුරා ව්‍යාප්ත වන බව ද මෙහි දැක්වේ. මෙම සියලු කුෂ්ට රෝගීන් ද පැවිදි කිරීම තහනම්ය. **කිලාස** යනු ද කුෂ්ට විශේෂයක් ම වේ. නමුත් මේවා බිඳී පිපිරී ඕජාව ගලන ඒවා නොවේ. වර්තමානයේ අප කබර නමින් හඳුන්වන රෝගයට සමාන රෝගයකි. **සොස** යනු ශ්වසනරෝගයක් වන අතර **අපමාර** යනු අපස්මාරයයි. පිත හා අමනුෂ්‍ය බලපෑම යන හේතු දෙක නිසාම මෙම අපස්මාර රෝගය සෑදිය හැකි අතර පූර්වවෛරී අමනුෂ්‍යයන් නිසා සිදුවන අපස්මාරය පිළියම් කිරීමට අපහසු ආබාධ තත්වයක් වේ.[19]

වා පිත් සෙම් කොපයෙන් හටගන්නා රෝග වාතරෝග පිත්තරෝග හා සෙම්හ රෝග යනුවෙන් දැක්වේ. මේවාට විවිධ වරේචන නශ්‍යකර්ම ආදිය පෙන්වා දී ඇත. **සන්නිපාත රෝග** යනු මෙම ත්‍රිදෝෂයන්ම බලවත්ව නැගුණු කල්හී ඇතිවන රෝගයි. මෙම රෝග නාමාවලියේ සමගාමීව දක්වා ඇති අනෙක් ආබාධය වන්නේ **උතුපරිණාමජ ආබාධයි.** දේශගුණික විපර්යාස හේතුවෙන් මෙකී රෝග හටගැනේ. විදේශයකට හෝ වෙනත් පළාතකට යන පුද්ගයෙකුට අධික ශීතල අධික උෂ්ණ ආදි දේශගුණික වෙනස්කම්වලට මුහුණ දීමට සිදුවීමෙන් මෙකී ආබාධ තත්වයන් ඇතිවිය හැකිය. චරකසංහිතාවේ **පරිණාම** යනුවෙන් දක්වා ඇත්තේ මෙබඳු රෝග වේ. සූර්යා නිසා ඇතිවන රෝග හතරක් පිළිබඳව මිළින්දපඤ්හයේ සඳහන් වන බවද මෙහිලා සඳහන් කළ යුතුය. ඒවා 1 අබ්භ 2 මහික 3 මෙඝ 4 රාහු යනුවෙන් දක්වා ඇත. තවද **ප්‍රඥාපරාධ** යටතේ චරකසංහිතාවේ විස්තර කළ රෝග විශේෂය බෞද්ධ සාහිත්‍යය පාර්ශ්වයෙන්

**විසමපරිහාරජ ආබාධ** ගණයට ඇතුළත් කළ හැකිය. විෂම ලෙස ඉරියව් පැවැත්වීමෙන් ඇතිවන කොන්දේ අමාරුව වැනි දණිස් අමාරුව වැනි ආබාධ මේ ගණයට අයත් වේ. **අතිචිරට්ඨාන නිසජ්ජාදිනා විසමපරිහාරෙන ජාතා** යනුවෙන් බොහෝ වේලාවක් සිටීම හිඳීම ආදී විෂම පැවැත්මෙන් හටගැනෙන ආබාධ ලෙස එම රෝගය සැදිය හැකි ආකාරය ටීකාවන්හි දක්වා ඇත. අධික බර ඉසිලීම අධික ලෙස බඩගින්නේ සිටීම ආදියෙන් ද මෙම රෝග තත්වය මතුවේ. වෙනත් අයගේ උපක්‍රම හේතුවෙන් ද කෙනෙකු ආබාධිත තත්වයට පත්විය හැකිය. එසේ ඇතිවන ආබාධ තත්වයන් **ඔපක්කමික ආබාධ** ලෙස නම් කෙරේ. මීට අමතරව පූර්ව කර්ම හේතුවෙන් විඳවන **කර්මවිපාකජ ආබාධ** විශේෂයක් ද වේ. ඉහත විස්තර කළ පිත්තසමුට්ඨාන ආබාධ, වාතසමුට්ඨාන ආබාධ, සෙම්හ සමුට්ඨාන ආබාධ, සන්නිපාත ආබාධ, උතුපරිණාමජ ආබාධ, විසමපරිහාරජ ආබාධ, ඔපක්කමික ආබාධ යන සප්ත ආබාධයන්ගෙන් ඇතිවන කායික වේදනාව ප්‍රතීකාර මගින් සමනය කළ හැකිය. එහෙත් කර්ම විපාකජ ආබාධ තත්වයන් එසේ බේත් හේත් සමනය කළ නොහැකිය. ඒවාට පිළියම් කිරීම අපහසු වන අතර අදාළ කර්මයට නිසි ආදීනව විඳීමෙන්ම ඒවායේ ව්‍යපශමනය බලාපොරොත්තු විය යුතුය. එසේම බටහිර වෛද්‍යවිද්‍යාවෙහි නො පිළිගැනෙන එහෙත් ආයුර්වේදයෙහි පිළිගැනෙන රෝග විශේෂයක් ගැන ද බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. ඒවා නම් යක්ෂ භූත ප්‍රේත පිශාචාදීන්ගෙන් වන්නා වූ රෝග වේ. ආයුර්වේදයේ මෙබඳු රෝග **ආධිදෛවික රෝග** නමින් සුශ්‍රැත සංහිතාවේ හැඳින්වේ. මහාවග්ගපාළියේ සඳහන් වන පරිදි වරක් එක්තරා භික්ෂුවකට අමනුෂ්‍යාබාධයක් වැළඳුණි. ආචාර්ය උපාධ්‍යායවරුන්ට එම රෝගය සංසිඳවීමට නොහැකි විය. රෝගී භික්ෂුව ඌරන් මරන ස්ථානයකට ගොස් අමු මස් කා ලේ බීවේය. එයින් ඔහුගේ රෝගය සංසිඳුණි.[20] එබඳු අවස්ථා සඳහා කරන ලද එම පිළියම සඳහා බුදුරදුන්ගේ අනුමැතිය ලැබුණි. ආචාරවිද්‍යාව හා බැඳුණු දර්ශනයක් වන බුදුදහම මෙවැනි ප්‍රතීකාර ක්‍රම පිළිගැනීම සම්බන්ධයෙන් අපගේ දැක්ම විචාරශීලී විය යුතුය. රෝගය හා රොගියා සම්බන්ධයෙන් බුදුන් වහන්සේ දක්වන ආකල්පය මෙයින් අනාවරණය වේ.

දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ ද තත්කාලීන භාරතයේ පැවැති එබඳු ප්‍රතිකාර ක්‍රම රාශික් හමුවේ.[21] **භූතවිජ්ජා** (භූතවිද්‍යාව), **ලෝහිතහොම** (උරහිසින් ලේ ගෙන කරන යාග), **සුභගකරණ** (යහපත උදාකරන මන්ත්‍ර), **දුබ්භගකරණ** (හූනියම්), **අදාසපඤ්හන** (අඤ්ජනම් බැලීම), **සන්තිකම්ම** (ශාන්තිකර්ම), **පණිධිකම්ම** (බාරහාර ඔප්පුකිරීම), **වත්ථුපරිකිරණ** (බලිබිලි) යනාදී අනේකවිධ ප්‍රතිකර්ම ක්‍රම පැවති අතර මේවා තිරශ්චීන විද්‍යාවන් ලෙස බුදුරදුන් පෙන්වා දී ඇත්තේ භික්ෂූන්ගේ මූලික අරමුණට මේවා හරස්ව යන (තිරියං ගච්ඡති) බැවිනි. එහෙත් කිසිදු තැනක ශාස්ත්‍රයක් වශයෙන් හෝ ගිහියෙකුගේ ක්‍රියාදාමයක් වශයෙන් නිග්‍රහයට පාත්‍ර නොවන බවද කිවයුතුය. මෙබඳු රෝග ගැන බටහිර වෛද්‍ය විද්‍යාවේ පිළිගැනීමක් හෝ ඊට එබඳු විසඳුමක් නිර්දේශ නොවේ. එබැවින් **බෞද්ධ ආයුර්වේදය** ලෙස ගොඩනැගෙන වෛද්‍ය ප්‍රතීකාර ක්‍රමයේ යන්ත්‍ර මන්ත්‍ර අභිචාර හා බැඳුණු පිළියම් පද්ධතියක් ද පවතින බව තේරුම් ගත යුතුය. බෞද්ධ දෘෂ්ටිය අනුව මෙබඳු ශාස්ත්‍ර පරම සත්‍යය ලෙස පිළි නොගැනෙන අතර මනෝ ප්‍රතිකාර ක්‍රමයක් ලෙස පිළිගැනේ.

වර්තමානයේ විවිධ රටවල විෂම චර්යාවන් නිසා ව්‍යාප්ත වන අපට නුහුරු රෝග ගැන අපි දනිමු. මෙවැනි රෝග සම්බන්ධයෙන් බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වන්නේ ආගන්තුක රෝග (**ආගන්තුකා රොගා**) යන්නයි. ඒඩ්ස් ඉබෝලා වැනි රෝග මෙසේ ආගන්තුක වශයෙන් ලෝකයට පැමිණි ඒවා වේ. විෂම පැවැත්ම අධිකවීමත් සමග ලෝකයේ තවත් මෙබඳු ආගන්තුක රෝගයන්ගේ පැමිණීම බලාපොරොත්තු

විය යුතුය. කෘෂිකර්මාන්තය ඇසුරින් සැදෙන රෝග කිහිපයක් **මූසික සලභ සුක පාණක සෙතට්ඨිකා මඤ්ජිට්ඨිකා** යනාදි නම්වලින් විනයෙහි දක්වා ඇත. ගණ්ඩ සල්ල ආදී රෝග සමුදායක් ද දක්වා ඇති අතර ඒවා ශල්‍යකර්ම කිරීම් මගින් ද සුවපත් කිරීමේ හැකියාව තිබේ. මේවා හැරුණුවිට වෙන වෙනම දැක්වෙන රෝග රාශියක් ද පෙළ සාහිත්‍යයේ දැකගත හැකිය. **කුච්ඡිරෝග** යනු ඉන් එකකි. ඉන් අදහස් වන්නේ විවිධාකාර වන බඩේ රුජාය. **අභිවාතක**[22] යනු වසංගත රෝගයක් විය හැකිය. **පණ්ඩුරෝගය** රුධිරය ආශ්‍රිත ඇඟ සුදුමැලිවීමේ රෝගයකි. **තිණපුප්ඵක** යනු (hay – fever) උණ රෝගයකි. **සරදින්නකාබාධය** යනුවෙන් තවත් රෝගයක් වේ. වශිකරණ බෙහෙත් බීමෙන් ඇතිවන රෝගයක් ලෙස මෙය දැක්වේ. (**සරදින්නකාබාධොති වසීකරණපානකසමුට්ඨිතරොගො**)[23] මෙයට අනුදැන වදාරා ඇත්තේ **සීතලොළි** නම් කල්කයයි. එය සීසෑමේ දී නගුලේ සීවැලෙහි ඇලෙන මැටි දියකර ගැනීමෙන් සාදාගනු ලබයි. දැනට ආයුර්වේදයෙහි පිළිගැනෙන **පක්ෂඝාත** නම් කෙනෙකුගේ සිරුරේ අතක් පයක් හෝ එක් පැත්තක් අක්‍රිය වීමෙන් හටගැනෙන අප විසින් අංශභාගය නමින් දන්නා ආබාධයට සමාන ආබාධයක් **පක්ඛහත** නමින් පෙළෙහි දැක්වේ. (**පක්ඛහතොති යස්ස එකො හත්ථො වා පාදො වා අද්ධසරීරං වා සුඛං න භවති**) සරීරසන්ධි පුරුක් අතර දැඩි වාත වේදනාවක් උපදවන රෝගය **පබ්බහත** නමින් දක්වා ඇත. ආයුර්වේදයේ මෙම රෝගය **වාතරක්ත** නමින් සලකා ඇත. තවත් දේශගුණික ආබාධයක් ලෙස **සාරදික ආබාධය** සැලකේ. සරත් ඍතුවේ දී සැදෙන්නකි. මෙය පිත්තාබාධයක් ලෙස ද සැලකේ. (**සාරදිකෙන ආබාධෙනාති සරදකාලෙ උප්පන්නෙන පිත්තාබාධෙන**) මෙම රෝගය වැළඳුණු කල අනුභව කළ සහ පානය කළ සියල්ල වමනය වන බවත් එහෙයින් ශරීරය කෘශ බවට පත් වන බවත් මහාවග්ගපාළියේ සඳහන් වේ. වැසි දිය හා මඩ පෑගීම, තෙමීම, ඒ අතර අව්වට වේලීම යනාදී හේතු නිසා මෙබඳු තත්වයක් ඇති වන බව කියැවේ. **සීපද** යනු තවත් ආබාධයකි. මෙය Elephantiasis නම් රෝගයට සමාන වූ ආබාධයක් ලෙස සැලකේ. බරවා රෝගය මෙය විය හැකිය. පාද මහත් වීම, කුෂ්ට ඇතිවීම, හම රළුවීම රෝග ලක්ෂණ වේ. (**සීපදීති භාරපාදො වුච්චති යස්ස පාදො ථූලො හොති සඤ්ජාතපිළකො ඛරො**) **ගලගණ්ඩ** නම් රෝගය සම්බන්ධයෙන් අර්ථකථා ග්‍රන්ථයන්හි සඳහන් වේ. (**ගලෙ ගණ්ඩො යස්සත්ථීති ගලගණ්ඩො**) බෙල්ලෙහි ගෙඩියක් තිබීම මෙම රෝගයේ ලක්ෂණයයි. **භගන්දරා** යනු ගුදය ආශ්‍රිතව හටගැනෙන තුවාලයකි. භග යනු ස්ත්‍රී යෝනියට නමකි. එය ඉරන විදාරණය කෙරෙන හෙයින් ද භගන්දරා නම් වේ. මෙය විනය ග්‍රන්ථයන්හි බොහෝවිට සඳහන් වන්නේ **අරිසභගන්දලා** යනුවෙනි. ආයුර්වේදයේ මෙය අර්ශස් හා භගන්දරා යනුවෙන් රෝග දෙකක් ලෙස විග්‍රහ කොට ඇත. මෙය බුදුසමයේ සලකා ඇත්තේ පාප රෝගයක් වශයෙනි. මෙම රෝගයෙන් පෙළෙනවුන් පැවිදි කිරීම තහනම් කොට ඇත. බුදුරදුන් දවස මෙම රෝගයෙන් පීඩිතව සිටි භික්ෂුවකගේ ගුදය තලගොයි මුඛයක් මෙනැයි අවශේෂ අය උපහාස කළ බවත් මේ සඳහා කරන ලද සැත්කමක් පිළිබඳව ද විනයෙහි සඳහන් වේ.[24] බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් වන ශල්‍යකර්ම සහ බුදුරදුන් ඒ සඳහා කරන ලද විවිධ නිර්දේශයන් ද විනය පිටකයෙහි අපට හමුවේ. සෞඛ්‍යමය සහ ආචාරවිද්‍යාත්මක ගැටළු හමුවේ බුදුරදුන්ගේ දැක්ම කෙබඳු වේ දැයි තේරුම් ගැනීමට මෙබඳු රෝග පිළිබඳ වාර්තා ඉතා උපකාරී වේ. කෙසේ වෙතත් භගන්දරා රෝගයට වර්තමානයේ **ක්ෂාර සූත්‍ර** ක්‍රමය සාර්ථක ප්‍රතිකාරයක් ලෙස සැලකේ. මෙබඳු රෝග රාශියක නම් විනය විනිශ්චය ටීකාවෙන් ද දැකගත හැකිය. ඒ අනුව **භාරපාද** (බරවා) **වාතණ්ඩ** (අණ්ඩවාතය) **ගණ්ඩංගුලි** (ගල්තැලුම්)

**විසගණ්ඩක** (විසප්පු) **පිට්ඨිකපාද** (විලුඹ බිම තැබීමට නොහැකි වීම) **මම්මන** (ගොත ගැසීම) **සෙතකුට්ඨ** (සුදුකබර) යනාදී රෝග රාශියක් වේ. මේවා සංඛ්‍යාත්මක වශයෙන් සියගණනක් (රොගසතානි) වන බව ද සඳහන් වේ. බුදුන් වහන්සේ එවකට පැවති අයුර්වේදීය වෛද්‍ය ක්‍රමය ගැන මැනවින් දැන සිටි බව තේරුම් ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි රාශියක් අපට බුදුරදුන්ගේ විවිධ ධර්ම විවරණ හා විනය ප්‍රඥප්ති ආශ්‍රයෙන් ප්‍රකට වේ. නිදසුනක් දක්වතහොත් ආයුර්වේද ශාස්ත්‍රයේ **ශාලාක්‍ය තන්ත්‍රය** ගත හැකිය. සුශ්‍රැත සංහිතාවේ එය විස්තර කොට ඇත්තේ **ඌර්ධ්ව අංග චිකිත්සා යනුවෙනි. භෝජ නිමි කාංකායන ගාර්ග්‍ය හා ගාලව** යන ශිෂ්‍යයන් පස්දෙනාට මෙම ශාස්ත්‍රය ඉගැන්වූ බවත් එහි සඳහන් වේ. ශාලාක්‍ය යන්නෙන් කියැවෙන්නේ කන් ඇස් නාස මුහුණ ආදී උඩ කොටසේ ඇති වන රෝග නිවාරණයයි. වෛද්‍ය නොවන යම් ග්‍රන්ථයක මෙම වචනය ගැන සඳහනක් වේ නම් ඒ දීඝනිකායේය. එහි මෙය දැක්වෙන්නේ **සාලාකිය** යනුවෙනි.[25] ශබ්දවිද්‍යාත්මක යුක්තීන් අනුව ද **සාලාකිය** යන්න **ශාලාක්‍ය** යන්නෙන් පැමිණීමේ හැකියාවක් ඇත. බෞද්ධ ග්‍රන්ථවල දැක්වෙන **චක්ඛුරොග සොතරොග ඝාණරොග ජිව්හාරොගා මුඛරොග දන්තරොග ඔට්ඨරොග පිනාස** යනාදිය සඳහා නිර්දිෂ්ට ප්‍රතිකාර ක්‍රම අයත් වන්නේ මෙම **ශාලාක්‍ය** හෙවත් **සාලාකිය** ගණයටය. මේවා පිළිබඳ සිතා ගත නොහැකි තරමේ පුළුල් විග්‍රහයක් බෞද්ධ සාහිත්‍යයේ දක්නට ලැබේ. සියල්ල විස්තර කිරීම මෙහිලා අනවකාශ හෙයින් මෙම රෝග ලයිස්තුවේ මුලින්ම දැක්වෙන **අක්ඛිරොග** හෙවත් ඇස් රෝග සම්බන්ධයෙන් දැක්වෙන නේත්‍ර විකාර පිළිබඳව පමණක් ගෙනහැර දැක්වේ. ඒ අනුව **අතිමහන්තක්ඛි** නම් ඇස **ප්‍රමාණයෙන්** විශාලවීමේ රෝගය **අතිඛුද්දකක්ඛි** නම් ඇස ඉතා කුඩා වීමේ රෝගය **විසමක්ඛි** නම් එක ඇසක් කුඩා වී එක ඇසක් විශාල වීම හෝ ඇස්ගුලි අසමතුලිත වීමේ රෝගය **කෙකරො අක්ඛි** හෙවත් ඇස් වපරවීමේ රෝගය **ගම්භීරක්ඛි** හෙවත් ගිලුණු ඇස් ඇතිවීම **නික්ඛන්තක්ඛි** හෙවත් ඇස් පිටතට නෙරා තිබීමේ රෝගය **පිංගලක්ඛි** නමින් බළල් ඇස් මෙන් ඇස් දුර්වර්ණවීමේ රෝගය **මධුපිංගලක්ඛි** නම් මී පැහැති ඇස් ඇති වීමේ රෝගය **නිප්පඛුමක්ඛී** නම් ඇහි බැම හෝ ඇහිපිය ලොම් නැතිවීමේ රෝගය **අක්ඛිපාක** නම් ඇස් කොන් පුපුරා තුවාලවීමේ රෝගය **අස්සුපග්ඝරණක්ඛි** ඇසින් නිතර කඳුළු පිටවීමේ රෝගය **පුප්ඵිතක්ඛි** නම් ඇස තුළ නිය මල් පිපීම මෙන් කිසියම් පිපීමක් තිබීමේ රෝගය යනාදී වශයෙන් රෝග සෑහෙන සංඛ්‍යාවක් බෞද්ධ අර්ථකථන ග්‍රන්ථවල දක්වා ඇත. ඇස කන නාසය තොල් මුහුණ උගුර ආදී ශාරීරක අවයව ආශ්‍රිතව ඇතිවන විවිධ ආබාධ සම්බන්ධ විනිශ්චයන් තවත් බොහෝ සංඛ්‍යාවක් මෙම අටුවාවන්හි දක්නා ලැබේ.[26] මෙබඳු රෝග විනිශ්චයන් දැක්වීම හා ප්‍රතිකාර නිර්දේශයන් විෂයෙහි බුදුන් වහන්සේ සහ අටුවාචාරීන් තුළ තිබූ දැනුම කෙතරම් විස්මයජනක ද යන්න ආයුර්වේද ශාස්ත්‍රය හදාළ කෙනෙකුට වටහා ගැනීම පහසුය.

ස්ත්‍රීරෝග පිළිබඳව ඉගැන්වෙන ශාස්ත්‍රය ආයුර්වේදයේ දැක්වෙන්නේ නාරිවේදය යනුවෙනි. එතරම් පුළුල්ව නොවුනත් ස්ත්‍රීරෝග සම්බන්ධයෙන් ප්‍රමාණවත් කරුණු කිහිපයක් බෞද්ධ ග්‍රන්ථවල සාකච්ඡා වනුයේ භික්ෂුණී පැවිද්ද පසුබිම් කොට ගෙනය. යෝනි රෝග හෙවත් ස්ත්‍රීලිංගය ආශ්‍රිතව ඇතිවන ආබාධ, ආර්තවය හෙවත් ඔසප්වීම, භ්‍රෑණ වර්ධනය හෙවත් කලල වැඩීම, ගර්භධානය හෙවත් ගැබ් දැරීම, ප්‍රසවය හෙවත් දරුවන් බිහිකිරීම, ගර්භපාතය හෙවත් ගබ්සාව යනු කරුණු සම්බන්ධයෙන් කරුණු වැඩි වශයෙන්ම සඳහන් වන්නේ **චුල්ලවග්ගපාළි**යේ භික්ඛුනික්ඛන්ධකයේය. ඒ අනුව භික්ෂුණියක වීමට මනා ලිංගික පිහිටීමක් තිබිය යුතුවේ. එයින් අදහස් කෙරෙනුයේ ලිංගික රෝග නොතිබිය යුතු බවයි. භික්ෂුණියක වීමේ දී මෙසේ වීමේ යුක්තිය වෛද්‍යවිද්‍යාව දන්නෙකුට තේරුම් ගැනීම පහසුය. කෙසේ

වෙතත් ප්‍රාථමික ලිංගික ලක්ෂණ නැති හෝ යෝනි මාර්ගය කෙස්සිදුරක් තරම් වන පරිදි පිහිටා ඇති ආබාධ තත්වය (**අනිමිත්ත**) ද නිතර වැගිරෙන රෝග තත්වය (**පග්ඝරණ**) ද වියලුණු ඔසප් ඇති රෝග තත්වය (**අලොහිතා**) නිතර රුධිරය පිටවීමේ (**ධුවලොහිතා**) රෝග තත්වය ද පිටතට නික්මුණු යෝනියක් තිබීමේ (**සිඛරිණී**) රෝග තත්වය ද ගුද හා යෝනි එක්ව පිහිටීමේ (**අසම්භින්නා**) රෝග තත්වය ද යනාදී රෝගී තත්වයන් ඇති ස්ත්‍රීන් විනයට අනුව මහණ කිරීම තහනම්ය. එසේම ඍතු කාල හා සම්භෝග කළලයක පිහිටීම ආදිය ගැන ද විස්තර අටුවාවන්හි දක්නට ලැබේ. ඔසප් වීම හේතුවෙන් ඇතිවන අපහසුතාවන්ට භික්ෂුණීන් මුහුණ පෑ අයුරුත් ඒවාට දක්වන ලද විසඳුම් පිළිබඳව ද දීර්ඝ සාකච්ඡාවන් භික්ඛුනීක්ඛන්ධකයෙහි දක්නා ලැබේ. තවද **කලලය අබ්බුද පේසි ඝන පසාඛ**[27] යනාදී අවස්ථාවන්ට පැමිණෙමින් අනුක්‍රමයෙන් වර්ධනය වන ආකරය විග්‍රහ කොට ඇති ආකාරය වෛද්‍යවිද්‍යාවට අනුකූල බව ආයුර්වේදිකයන්ගේ මතයයි. ගබ්සාවට ඖෂධ වර්ග යෙදූ බව විනය පාරාජිකා විවරණවල දක්නා ලැබෙතත් එකී ඖෂධ කවරේදැයි නො දැක්වේ. බුදුන් දවස එක්තරා සත්‍රියක සොර සැමියෙකු සමඟ කළ ඇසුරක් හේතුවෙන් ගැබ්ගත් විට එය ගබ්සා කොට හිතවත් භික්ෂුණියක ලවා පාත්‍රයට දමා විසි කරවීමට දරණ ලද තැතක් ගැන බුදුරදුන් දැන ගැනීමෙන් පසු එසේ කිරීම වළක්වාලමින් ශික්ෂාපදයක් ද පණවන ලදී.[28] මෙසේ ස්ත්‍රීන්ටම පොදු වූ ශාරීරික ස්වස්ථතා ක්‍රමවේද පිළිබඳ ආයුර්වේදීය ඥානයට එකඟ වන දැනුම් සම්භාරයක් බෞද්ධ සාහිත්‍යයෙහි ද විස්තෘත වේ.

**ප්‍රතීකාර**

යථෝක්ත රෝග සම්බන්ධයෙන් බටහිර හා ආයුර්වේදීය විග්‍රහයන් පුළුල් බව අපි දනිමු. මෙකල මෙම රෝග අතිශය සංකීර්ණ බවට පත් වී ඇති අතර ඒවාට ඇතැම්විට ප්‍රමාණවත් ප්‍රතීකාර ලැබෙන නමුත් ඇතැම් රෝග නිශ්චය කිරීමට ද වෛද්‍යවරු අපොහොසත් වෙති. බටහිර ප්‍රතීකාර ක්‍රම විශේෂයෙන් දියුණු වී ඇත්තේ ආයුර්වේදයේ ප්‍රතීකාර ක්‍රම පිළිබඳ කරන ලද පර්යේෂණ ක්‍රම හේතුවෙන් බව ද පිළිගත යුත්තකි. ආයුර්වේදය පෝෂණය කිරීමට බෞද්ධ ප්‍රතීකාර ක්‍රම ඉවහල් වූ බව ද එසේම පිළිගත යුත්තක් වේ. **මහාවග්ගපාළි**යේ භේසජ්ජක්ඛන්ධකය වැනි මූලාශ්‍රයන් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකින් මෙය තහවුරු කොට ගත හැකිය. බුදුදහම වෛද්‍ය ශාස්ත්‍රයක් නොවුණ ද ඇතැම් රෝග නම් කිරීමත් ඒවාට යෝග්‍ය ප්‍රතීකාර නිර්දේශ කර ඇති ආකාරයත් විමසන විට අතිශය පුළුල් දැනුම් සම්භාරයක් විකසිත කළ හැකිය. චක්ඛුපාල තෙරුන්ගේ අක්ෂිරෝගයට සැකසූ බෙහෙත් විධිමත් ලෙස පාවිච්චි නොකිරීම හේතුවෙන් රෝගය උත්සන්න වූ බව **ධම්මපදට්ඨකථා**වෙහි සඳහන් වේ. වරක් බුදුන් වහන්සේට උදරාබාධයක් ඇති වූ කල්හි සැකසූ බේත් හේත් විනයෙහි ගැන සඳහන් වේ. උණු දිය ස්නානය කොට අලු රහිත උක් සකුරු පිඬක් දියකොට උණුවතුරෙන් පානය කිරීමට සැලැස්වීමෙන් රෝගය සංසිඳුණු බව කියැවේ. එහිදී ස්නානය කිරීමෙන් **බහිපරිසේචන**යත් උක්සකුරු උණු වතුරෙන් මිශ්‍රකොට බීමෙන් **අන්තොපරිසෙචන**යත් සිදුවන බව වැඩිදුරටත් දක්වා ඇත. තවද උදරාබාධ සඳහා සැකසූ බව කියැවෙන **තෙකටුලයාගු** නම් කැඳ ඉතා ප්‍රකටය. මෙය සකසා ඇත්තේ තල සහල් මුං මෑ හෝ කොල්ලු වැනි ධාන්‍යවර්ගයක් යොදා සතරෙන් කොටසක් වතුර මිශ්‍රකොට ගත් කිරෙහි දමා ගිතෙල් මී පැණි සහ උක් සකුරු ද එකතු කිරීමෙනි. මෙය උදරාබාධයට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් බව **භේසජ්ජක්ඛන්ධක**යේ සඳහන් වේ. සැරියුත් තෙරුන්ට ද මෙබඳු උදරාබධයක් සෑදුණු අවස්ථාවක එයට සකසන ලද බෙහෙතක් ගැන මෙහි ම සඳහන් වේ.

අක්ෂිරෝග කර්ණ රෝග ආදී රෝග සම්බන්ධයෙන් ජීවක නැමති වෛද්‍යවරයාගේ සහාය ලබාගත් බුදුන් වහන්සේ ඖෂධ, නශ්‍යකර්ම, විරේචන, තෛල අභ්‍යංග ආදිය මගින් භික්ෂු සංඝයාගේ ස්වස්ථතා සම්පාදනය සලසා ඇත. **පබ්බභත** නම් රෝගය පිළින්දවච්ඡ තෙරුන්ට වැළඳුණු බවත් දැඩි සන්ධි පුරුක් වේදනාවකින් පෙළුණු අවස්ථාවේ බුදුන් වහන්සේ එයට **රක්ත මෝචනය** අනුදැන වදාළ බවත් විනය පිටකයේ සඳහන් වේ. අටුවාව දක්වන පරිදි එහිදී සිදුකරණුයේ සුළු ශල්‍ය කර්මයක් මගින් රුධිරය පිටකර හැරීමකි. වර්තමානයේ ආයුර්වේදීය ක්‍රමයක් වන කුඩැල්ලන් යොදාගෙන ලේ පිටකරවීමට සැලැස්වීම එවැන්නකි. භික්ෂූන්ට වැළඳුණු යම් යම් රෝග හේතුවෙන් දක්වන ලද විවිධ ඖෂධ වර්ග පිළිබඳව විනය පිටකයෙහි සඳහන් වේ. විශේෂයෙන් මුල්බෙහෙත් වශයෙන් කහ (හලිද්දිං) ඉඟුරු (සිංගවෙරං) හෙළ වදකහ (වචං) අතිවිඩ (අතිවිසං) කුළුරැණ (කටකරොහිණිං) සුවඳහොට (උසීරං) වම්මුතු (භද්දමුත්තකං) යන මේවා අවශ්‍ය විටෙක ගැනීමට භික්ෂූන්ට නියම කොට ඇත. කෙහොඹ කෙළිඳ දුම්මැල්ල හඟුළු කරඳ යන ගස්වලින් සාදාගත් කසාය වර්ග ද ශාක පත්‍ර බෙහෙත් වශයෙන් කොහොඹ කොළ කෙළිඳ කොළ දුම්මැල්ල කොළ තළාකොළ කපුකොළ බෙහෙත් වශයෙන් වැළඳීමට ද නියම කොට ඇත. ගෙඩිවලින් සාදාගන්නා බෙහෙත් ලෙස වළගසාල් (විළංගං) තිප්පිලි (පිප්ඵලිං) ගම්මිරිස් (මරිචං) අරළු ( හරීටකං) බුළු (විභීටකං) නෙල්ලි (ආමලකං) කුකුරුමුවන් (ගොට්ඨඵලං) ද මැලියම් බෙහෙත් ලෙස පෙරුම්කායම් (හිංගු) හිංගුදඬු තම්බාගත් මැලියම් (හිංගුජතු) හිංගු කොළ තම්බාගත් මැලියම් (හිංගුසිපාටිකං) රුක් කරටියෙන් වැහෙන මැලියම් (තකං) රුක් කොළවලින් වැහෙන මැලියම් (තකපත්තිං) මේරු කොළ තම්බාගත් මැලියම් (තකපණ්ණිං) දුම්මල (සජ්ජුලසං) ද ලුණු බෙහෙත් ලෙස මුදුලුණු (සාමුද්දං) කළුලුණු (කාළලොණං) සහිඳලුණු (සින්ධවං) සුවසලුණු (උබ්භිදං) බළල්ලුණු (බිළාලං) ද බෙහෙත් වශයෙන් පරිභෝග කිරීමට අනුදැන ඇත. මෙකී බෙහෙත් වර්ග පොදු වශයෙන් විවිධ රෝග විෂයෙහි අනුභව කිරීමට කිසිදු බාධාවක් නැත. යම් යම් අවස්ථාවන්හි පැන නැගුණු රෝග සඳහා සරල ප්‍රතිකාර ක්‍රම ද පෙන්වා දී ඇත. පිළින්දවච්ඡ තෙරුන්ට ඇතිවූ හිසරදයකට නස්‍ය කර්මයක් කිරීම පාද පැලීමේ රෝගයට තෛලක් සෑදීම ඇඟ රුදාවට ස්වේද ගැන්වීම අනුදැනීම යනාදිය නිදසුන්ය.

බුදුන් වහන්සේ පවසන පරිදි **කායිකරෝග** හා **මානසික රෝග** යනුවෙන් රෝග දෙවර්ගයක් ඇත. කායික රෝග නොවැළඳී කෙනෙකුට වර්ෂ එකක සිට සියයක් තරම් දීර්ඝ කාලයක් නිරෝගිමත්ව ජීවත්විය හැකි වුවත් මානසික නිරෝගීභාවයෙන් යුක්තව මොහොතක්වත් ජීවත්වීම අපහසුය.[29] කුමක් නිසාද යත් ඊට අධ්‍යාත්මය උසස් තත්වයක පැවැතිය යුතු හෙයිනි. එබැවින් ස්වස්ථතාව පිළිබඳ බෞද්ධ විග්‍රහය අනුව මානසික ස්වස්ථතාව පිළිබඳ වැඩි අවබෝධයක් හා අවධානයක් තිබිය යුතුය යන්නයි. කායික ස්වස්ථතාව මානසික ස්වස්ථතාව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන බව විවාද රහිත කරුණකි. බුදුසමය අනුව කායික ස්වස්ථතාව මානසික ස්වස්ථතාව විෂයෙහි බලපායි. කායික රෝග ව්‍යපසමය උදෙසා වන නොයෙක් චර්යාවන් නිර්දේශ කරනුයේ එහෙයිනි. එයින් තොරව සීල සමාධි ප්‍රඥා යන අනුපූර්ව ශික්ෂාවන් සාධනය කළ නොහැකි ය. නිරෝගී බව මූලික වන කායපස්සද්ධිය නමැති චෛතසිකය දුර්වල වූ විට චිත්තපස්සද්ධිය ද දුර්වල වේ. මෙම චෛතසික ද්වය දුර්වල වූ තැනැත්තාගේ සිත අධිගම මාර්ගයට නොපෙළඹෙන අතර එයින් බැහැරවීමේ සිත ද පැන නැගේ. මේ නිසා බෞද්ධ ශික්ෂණ මාර්ගයේ සීලය නැමති පදනමට කායික ස්වස්ථතාව අනිවාර්ය අංගයකි. නිරෝගී බව නිසා ඇතිවන ප්‍රමෝද්‍යය පීතියට කරුණක් වේ. (පමුදිතස්ස පීති ජායති) ප්‍රීතිය නිසා කායික සංසිදීම වේ.

(පීතිමනස්ස කායො පස්සම්භති) කායික සංසිඳීම නිසා සුඛය ඇතිවේ. (පස්සද්ධකායො සුඛං වෙදෙති) මෙකී කායික සුඛය ආශ්‍රයෙන් චිත්ත සමාධිය ඇති වන බව (සුඛිනො චිත්තං සමාධියති) අංගුත්තරනිකායේ පඤ්චක නිපාතයේ **විමුත්තායතන සූත්‍රය** ඇතුළු සූත්‍ර රාශියක දක්නා ලැබේ. මේ නිසා බෞද්ධ ප්‍රතිපදාව විෂයෙහි කායික ස්වස්ථතාව ආවශ්‍යක අංගයක් වේ. බුදුසමය හා ආයුර්වේදයේ සුසංයෝගීතාව හා උපයෝගීතාව ගොඩ නැගෙනුයේ එලෙසිනි. අනෙක් අතින් මානසික ස්වස්ථතාව නොමැති පුද්ගලයාගේ කායික ස්වස්ථතාව ද පිරිහෙයි. මානසිකව ශක්තිමත් වන පුද්ගලයාට භෞතික ශරීරය සම්බන්ධයෙන් වන වේදනාවන් පාලනය කිරීමේ හැකියාවක් ඇත. එසේම කායික රෝගයක දී මානසිකව පිරිහීම රෝගය බරපතල හානියක් ද වේ. එබැවින් කායික හා මානසික ස්වස්ථතාවේ පදනම හා ස්වභාවය පිළිබඳ බෞද්ධ මූලාශ්‍රයන්හී එන දැනුම් සම්භාරය පිළිබඳ අවබෝධයක් තිබීම ද ප්‍රයෝජනවත් කරුණකි.

**ආන්තික සටහන්**

---

මෙම ලිපිය ලිවීම සඳහා සුමනපාල ගල්මංගොඩ මහාචාර්තුමන් විසින් ලියන ලද **බෞද්ධ ආයුර්වේදය මනෝකායික චිකිත්සා ක්‍රමය** නමැති කෘතියත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර් එස් ජයවර්ධනයන්ගේ **බෞද්ධ ආයුර්වේදයේ අවියෝජනීය අංගයක් ලෙස ආයුර්වේද චින්තාවේ සහ චිකිත්සාවේ වැදගත්කම** නමැති පර්යේෂණ නිබන්ධයත් කියවීමෙන් ලද දැනුම් සම්භාරය විශේෂයෙන් උත්තේජනය වූ බව සඳහන් කළ යුතුය.

1. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර **අපදානපාළි**යේ පිළින්දවච්ඡ වර්ගයේ ගාථා කියවීමෙන් ලබාගත හැකිය.
2. "රාගො දොසො ච - විසා සබ්බෙ සමූහතා
   අගදූපමො මහාවීරො - සො මෙ බුද්ධො නිමන්තිතො" - **අපදානපාළි** සෙලත්ථෙරාපදානය බලන්න.
3. බ්‍රාහ්මණො සමණො නාථො- භිසක්කො සල්ලකත්තකො - **අපදානපාළි** සුගන්ධත්ථෙරාපදානය බලන්න.
4. World Health Organization (1997) Review of the Constitution . . . , EB 10 1/7, p.2
5. Pancappakaranatthakatha, PTS, p. 207
6. **අංගුත්තරනිකාය** පඤ්චකනිපාතය අනාගතභය සූත්‍රය බලන්න.
7. **සංයුත්තනිකායට්ඨකථා** ඵෙණපිණ්ඩූපමසුත්තවණ්ණනා බලන්න.
8. එම
9. **මජ්ඣිමනිකාය** උපරිපණ්ණාසක කායගතාසතිසුත්ත
10. **ථේරගාථාපාළි** 569 ගාථාව බලන්න.
11. එම
12. එම
13. මේ ශරීරය දත් ඇට, අධික කොට ඇති තුන් සියයක් ඇටවලින් ද, එකසිය අසුවක් සන්ධිවලින් ද යුක්ත ය. නව සියයක් නහරවලින් වෙළී ඇත. එසේම එය නව සියයක් මස් වැදලිවලින් ද තෙත් සමකින් සිවියකින් එය වැසී ඇත. තෙල් පිරුණු සැළියක් මෙන් උඩින් යටින් දිළිසෙන බවත්, රෝග දුක්ඛ ධර්මයන්ට හේතු වී ඇති බවත් දැක්වේ. - **සිංහල විශුද්ධිමාර්ගය**, මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර, 285 පිටුව බලන්න.
14. Acarya Y,T, (2011), Caraka Samhita of Agnivesha with the Ayurvedadipika Commentary by Sri Cakrapanidatta, Chaukhamba Surbharati Prakasan, Varanasi, Nidana 1.3 & Cikitssa .6.6
15. **සුත්තනිපාත** බ්‍රාහ්මණධම්මිකසුත්ත බලන්න.

16. **අංගුත්තරනිකාය** දසකනිපාත සචිත්තවග්ග බලන්න.
17. **සමන්තපාසාදිකා** විනයට්ඨකථා හේවාවිතාරණ මුද්‍රණය 767 පිට බලන්න.
18. -එම- **පඤ්ච ආබාධවත්ථු** බලන්න.
19. "අපමාරොති පිත්තුම්මාරො වා යක්ඛුම්මාරො වා, තත්ථ පුබ්බවෙරිකෙන අමනුස්සකෙන ගහිතො දුත්තිකිච්ඡො හොති අප්පමත්තකෙ හි අපමාරෙ සති න පබ්බාජෙතබ්බො" **සමන්තපාසාදිකා** විනයට්ඨකථා හේවාවිතාරණ මුද්‍රණය **පඤ්ච ආබාධවත්ථු** බලන්න.
20. **මහාවග්ගපාළි** භෙසජ්ජක්ඛන්ධක මූලාදිභෙසජ්ජකථා බලන්න.
21. **දීඝනිකාය** බ්‍රහ්මජාලසුත්ත 'මහාසීල' විස්තරය බලන්න.
22. **සමන්තපාසාදිකා** විනයට්ඨකථා හේවාවිතාරණ මුද්‍රණය 749 පිට බලන්න.
23. See, Samantapasadika, P.T.S, p. 1092
24. **මහාවග්ගපාළි** භෙසජ්ජක්ඛන්ධක සත්ථකම්මපටික්ඛෙපකථා බලන්න.
25. **දීඝනිකාය** බ්‍රහ්මජාලසුත්ත 'මහාසීල' විස්තරය බලන්න.
26. සමන්තපාසාදිකා විනයට්ඨකථා හේවාවිතාරණ මුද්‍රණය 768 පිට
27. **සංයුත්තනිකායට්ඨකථාව** යක්ඛසංයුත්ත ඉන්දකසුත්තවණ්ණනා බලන්න.
28. **චුල්ලවග්ගපාළි** භික්ඛුනීක්ඛන්ධක 2. 268 පිට
29. **අංගුත්තරනිකාය** චතුක්කනිපාත රොගසුත්ත බලන්න.

**මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**
(B.A, M.A (Hons) (Kel.), M.A (Hons) (BP), Ph.d (Delhi),
Rajekeeya Pandit
**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**